# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,816 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1568 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1571 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1573 |


සැ. යු.- (i) ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජුලි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු — ඇබෑර්තු

## සංශෝධනයයි

### යටිනුවර ප්‍රාදේශීය සභාව

2013 මැයි මස 23 වැනි බ්‍රහස්පතින්දා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටස - පළාත් පාලනය කොටසේ පළ වූ යටිනුවර ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු යටතේ ආදාහනාගාර සහායක තනතුරේ වැටුප් පරිමාණය :

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| ආදාහනාගාර සහායක | 01 | PL2-2006A රු.11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා සිටිය යුතුය. |

***ලෙස පළ වී ඇත. එය පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතුය :-***

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| ආදාහනාගාර සහායක | 01 | PL1-2006A රු.11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා සිටිය යුතුය. |

සී. පී. නවරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

06-378

---

## සංශෝධනයයි

### උඩුනුවර ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

ඉහත කරුණට අදාළව 2013.05.17 වැනි දින පළකරන ලද ගැසට් නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව නිවේදනය කරමි.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 06 | මාර්ග කම්කරු III ශ්‍රේණිය | 05 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු.17,600 (රා.ප.ච. 06/2006 iv) PL-1-2006A වැටුප් කේතය 01 වැනි වැටුප් පියවර ආරම්භක පියවර වශයෙන් සැළකේ. (04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර/(සා/පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2013.06.28 දක්වා දීර්ඝ කරනු ලබන බව දන්වමි.

ආර්. එච්. එම්. අයි. මැණිකේ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2013 ජුනි මස 03 වැනි දින,
ගෙලිඔය,
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-472

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මීගමුව මහනගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර, "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2013.07.21 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වෙළඳසැල් පරිපාලක II ශ්‍රේණිය | 01 | MN1-2006Aආරම්භක වැටුප් පියවර 13,120, 4 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (සටහන 01 බලන්න) |

*සටහන 01* :- වෙළඳසැල් පරිපාලක තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය ; සහ

*(ආ)* මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර සිංහල හා දෙමළ භාෂා වලින් කථා කිරීමට හැකියාව තිබිය යුතුය.

*සේවා කොන්දේසි හා නියමයන් :-*

*(අ)* මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

*(ආ)* වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*(ඇ)* තෝරාගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීම් කාලයකට යටත්කර බඳවාගනු ලැබේ.

*වෙනත් පොදු කොන්දේසි :-*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

02. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

03. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

06. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය* .- වෙළඳසැල් පරිපාලක තනතුරුවලට බඳවාගනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
මීගමුව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**මීගමුව මහ නගර සභාව**

(කාර්යාලයීය ප්‍රායෝජනය සඳහා)

.......................................................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :——————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
03. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
04. ස්ථිර පදිංචි ලිපිනය:——————————.
05. තැපැල් ලිපිනය:——————————.
06. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
07. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————.
08. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය:——————————.
09. උපන් දිනය:——————————.
10. 2013.07.21 දිනට වයස:——————————.
11. අධ්‍යාපන සුදුසුකම්:——————————.
12. පළපුරුද්ද:——————————.
13. වෘත්තීය සුදුසුකම්:——————————.
14. වෙනත් සුදුසුකම්:——————————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේද යන වග:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත් බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන...................................... මහතා/මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ................................ වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————.
තනතුර :——————————.
දිනය:——————————.

06-565

---

## සංශෝධනයයි

**හැටන් දික්ඔය නගර සභාව**

2013.04.26 දිනැති අංක 1808 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (ආ) පළාත් පාලන තනතුරු ඇබෑර්තු යටතේ පළ කරන ලද නිවේදනයේ අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බව දන්වා සිටිනු ලැබේ. ඒ අනුව ලැබී ඇති අයදුම්පත්‍ර වල සුදුසුකම් සළකා බලනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | ලොරි/ට්‍රැක්ටර් රියැදුරු | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145- 10 x 160- 12 x 170 - රු. 18,860 (රා.ප.ච. 6/2006 (iv) PL 3 2006 (A) වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර ළඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 2කට සම්මාන සහිතව පියවර වශයෙන් සැලකේ. (4 වැනි වැටුප් විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතු ය. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකය හා වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය) අවම උස අඩි 05 ක් විය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |
| 03 | කර්මාන්ත කම්කරු | 02 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x145 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006 (iv) PL1 2006 (A) වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වැනි වැටුප් පියවරට ළඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතු ය. |

කේ. ඒ. පී. කුලසූරිය,
ලේකම්,
හැටන් දික්ඔය නගර සභාව,
හැටන්.

06-363

# පළාත් පාලන නිවේදන

## වරකාපොල ප්‍රාදේශීය සභාව

ආදාහනාගාරය පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2008.10.31 වැනි දින පළ කරන ලද IV (ආ) කොටස ගැසට් පත්‍රයේ 1736 පිටුවේ සඳහන් ආදාහනාගාරයක් පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අංක 1, 2 යටතේ සඳහන් වගන්ති පහත පරිදි 2013.01.01 දින සිට සංශෝධනය කෙරේ.

1. වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එක් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තුව රු. 6500 කි.
2. වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත එක් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා රු. 7500 කි.

06-417

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2012.11.28 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 5.1.7 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. අතුල නිලංග බණ්ඩාර හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 27 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස හා ඉදිකිරීම් කටයුතු භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවල අංක I කොටස හා II කොටසේ 1 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථා රඹුක්කන ප්‍රාදේශීය සභාව ඒ ආකාරයෙන්ම පිළිගෙන වැළඳ ගැනීමට සුදුසු බව යෝජනා කරන්නීය.

06-386

---

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුලත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුල යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. දිනේෂ් ගුණරත්න,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
අරණායක.

2013 මැයි මස 28 වැනි දින,<br>
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | විහාරවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය හා අවසානය | : | ඇරැව්පල සිට මාවනැල්ල මාර්ගයේ මැදගෙදරවත්ත කුඹුර ඉඩමෙන් ආරම්භව හිරිවල්අඹේහේන ඉඩම අසලින් කටුගහ මාර්ගයට සම්බන්ධ වෙයි. |
| ග්‍රාම සේවක වසම | : | ගම්මන්නාගොඩ වසම |

මාර්ගයේ දිග : මීටර් 500 පළල : අඩි 10

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම්හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | | | |
|---|---|---|---|
| 1. | මාවෙල සුමංගල හිමි | - | පන්සලේ වත්ත |
| 2. | පී. වී. සෙනෙවිරත්න මයා | - | පහලවත්ත |
| 3. | යූ. ජී. පොඩිඅප්පුහාමි මයා | - | හිරිවල් අඹේහේන |
| | යූ. ජී. මද්දුම බණ්ඩාර මයා | - | |
| 4. | කේ. ඩී. ජයරත්න මයා | - | හිරිවල් අඹේහේන |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම්හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | | | |
|---|---|---|---|
| 1. | මාවෙල සුමංගල හිමි | - | මැදගෙදරවත්ත කුඹුර |
| 2. | යූ. ජී. දසනායක මයා | - | විහාරඋඩහවත්ත |
| 3. | යූ. ජී. පොඩිඅප්පුහාමි මයා | | |
| | යූ. ජී. බේබිනෝනා මිය | - | විහාරඋඩහවත්ත |
| 4. | පී. වී. සෙනෙවිරත්න මයා | - | පහලවත්ත |
| 5. | පී. වී. වසන්ත අමරසිංහ | - | පහලවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ අංක 6131 හා 2009.08.01 දිනැති පිඹුරුපත පරිදියි.

06-384

# විවිධ දැන්වීම්

**උකුවෙල ප්‍රාදේශීය සභාව**

2013 වසර සඳහා ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වගන්තිය ප්‍රකාර පහත සඳහන් වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් බද්දක් 2013 වසර සඳහා පනවා අය කිරීමට 2013.01.15 දින තීරණ අංක 04-04-02 යටතේ පැවති මහ සභාවේ යෝජනා සම්මුතිය අනුව තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් දන්වනු ලැබේ.

| වෙළෙඳ ව්‍යාපාරය | ගෙවිය යුතු බද්ද |
|---|---|
| | රු. ශ. |
| 01. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යෑම | 3,000 0 |
| 02. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිහිටි ප්‍රදේශයේ පරිසර හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා (රජය විසින් පනවනු ලබන බදු අයකරණු ලැබේ.) | 25,000 0 |

සමන්ත ධර්මසේන,
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

06-364

---

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

කසල ගාස්තුව - 2013 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126 (ix) ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2008 දෙසැම්බර් මස 23 වැනි දින සම්මත කර ගත් පොදු අතුරු ව්‍යවස්ථාව අනුව කසල ශෝධන සේවාව සලසනු ලබන දැහැම් මාවත, මැජස්ටික් කෝට් ගම්මානය, මාලිගාතැන්න ගම්මානයේ ආරම්භක කොටස්, අලස්වත්ත ගම්මානය, කොලේජ්විව් ගම්මානය, මැදගොඩ ඇතුළු කසල එකතු කිරීමේ විශේෂ ව්‍යාපෘතියට ඇතුලත්වීමට කැමති ප්‍රදේශ හා මාර්ගවල පදිංචි වරිපනම් අය නොකරන නිවෙස්වලින් රු. 75.00 ක, කසල ගාස්තුවක්ද, ව්‍යාපාරික ස්ථානවලින් රු. 100.00 ක කසල ගාස්තුවක්ද, තුන් මසකට වරක් අය කිරීමට 2012 දෙසැම්බර් මස 28 වැනි දින මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පැවති මාසික සභා රැස්වීමේ තීරණ අංක 7:1 අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

06-574

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.